# 18 ක්‍රිස්තුන් වහන්සේට අයත් අප

**දෙවියන් වහන්සේ අපේක්ෂා කරන්නේ මනා ජීවිත රටාවකින් යුත් යහපත් සමාජයකි. එවන් සමාජයක පැවැත්ම උදෙසා පවුලක ක්‍රියාකාරීත්වය කෙලෙස විය යුතුද යන්න අධ්‍යයනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**උත්පත්ති 2:18-25, කොලොස්සි 3:12-17, 3:18-21, එපීස 5:21-6:4, ශු. මතෙව් 25:31-46, තීතස් 3:1-2, ජාකොබ් 2:1-4,**

**මිනිසා ජීවත්වන සමාජය** ගැන විමසන විට **යහපත් සමාජයක** අවශ්‍යතාව එහි වැසියන්ගෙන් අපේක්ෂා කෙරේ.

සමාජයක් යනු මිනිස් වර්ගයාගෙන් සැදුම්ලත් එකකි. ලෝකය තුළ ශ්‍රී ලංකාව ද එක්තරා සමාජයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ වෙසෙන අපි එම සමාජයේ පුරවැසියෝ වෙමු.

සැම කෙනකු ම අනිවාර්යයෙන් අයත් වන කුඩා ම සමාජ ඒකකය වන්නේ **පවුල යි.**

ලෝකය මැවීමේ දී සියල්ල යහපත් ලෙස නිම කළ උන්වහන්සේ ඒවා යහපත් ලෙස ම පවත්වාගෙන යාම මිනිසාගෙන් අපේක්ෂා කළ සේක. එබැවින් සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීම ආරම්භ වන්නේ අපගේ පවුල නමැති ඒකකයෙන් බව අවබෝධ කරගැනීම වැදගත් වේ.

**පවුලේ නිර්මාතෘ දෙවිපියාණන් වහන්සේ ය.**

**කියවා බලමු.**

**උත්පත්ති 2:18-25**

දෙවි සමිඳාණන් වහන්සේ අහස පොළොව හා ඇති සියල්ලත් මැවූ සේක. දූවිල්ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස් පුඩුවලට ජීවනයේ හුස්ම හෙළා මනුෂ්‍යා ජීවමාන කෙනකු කළ සේක. අනතුරු ව "මනුෂ්‍යා තනිව සිටීම හොඳ නැත. ඔහුට සුදුසු සහකාරියක් මවා දෙමි" යැයි පවසා මිනිසාගේ ඉල ඇටවලින් එකක් ගෙන ඔහුට ස්ත්‍රියක් මවා දුන් සේක. ඇයට ඒව (ජීවමාන සියල්ලන්ගේ මාතාව) යන නම ආදම් (මිනිසා) විසින් තබන ලදී.

මේ අනුව බලන කල ආදම් සහ ඒව දේව මැවිල්ලේ උසස් ම නිර්මාණය යි. ඒ නිසා මිනිසුන් අතර එකිනෙකා සමග වෙන් කළ නොහැකි මහත් බැඳීමක්, සබඳතාවක් පවතී.

මින් අපට පැහැදිලි වන්නේ මිනිසා සාමූහික ජීවිතයක් ගතකිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බවයි.

මේ දෙදෙනා වෙතින් මිනිස් වර්ගයාගේ වර්ධනය වීම සිදුවන අතර, ඒ තුළින් සමාජය බිහිවෙන බව පැහැදිලි වෙයි.

මුළු මහත් ලොව ම එක ම සමාජයක් ලෙස සලකනු ලබද්දී පවුල නමැති ඒකකය ලොව තුළ නිර්මාණය වී ඇති කුඩා ම සමාජ සංස්ථාව ලෙස අපි හඳුනා ගතිමු. අප එක් එක් පුද්ගලයාගේ යහපැවැත්ම උදෙසාත් සමස්ත සමාජයේ යහපැවැත්ම උදෙසාත් ශු. බයිබලය තුළින් අප වෙත ගෙන එන දේව රාජ්‍යයේ **වටිනාකම්** එමට ය. එම වටිනාකම් අන්‍යෝන්‍ය බැඳීමකින් යුතුව, **යුතුකම් හා වගකීම්** ලෙස ඉටු කිරීම අපෙන් බලාපොරොත්තු වේ.

## කිතුනු පවුලේ යුතුකම් හා වගකීම්.

**භාර්යාව හා ස්වාමිපුරුෂයාගේ වගකීම.** - එපීස 5 ඃ 21-33

- ❖ ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා එකිනෙකාට යටත් වන්න.
- ❖ භාර්යාවෙනි, ඔබ සමිඳාණන් වහන්සේට මෙන් ස්වාමිපුරුෂයාට යටත් ව සිටින්න.
- ❖ පුරුෂයෙනි, ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් දිවි පුද කළා මෙන් ඔබත් ඔබගේ භාර්යාවට ප්‍රේම කරන්න.
- ❖ පුරුෂයන් විසින් සිය භාර්යාවට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතු ය.

දෙවියන් වහන්සේ පුරුෂයා හා ස්ත්‍රිය වශයෙන් මනුෂ්‍යා මැවූ සේක.උන්වහන්සේගේ මැවිල්ල තුළ පුරුෂයාට හා ස්ත්‍රියට හිමි වන්නේ සම තත්ත්වයකි. දෙවියන් වහන්සේ පුරුෂයාට දී ඇත්තේ සහකාරියකි. දෙවියන් වහන්සේගේ මැවිල්ල වන මනුෂ්‍යා ප්‍රේමයෙන් යුතුව ජීවත් වීම උන්වහන්සේගේ බලාපොරොත්තුව වේ. එබැවින් පුරුෂයා තම භාර්යාවට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතු වේ . එනම් තමා තමාට කෙතරම් ආදරය කරන්නේ ද, ගෞරව ලැබීමට කැමැත්තේ ද, රැක ගැනීමට කැමැත්තේ ද තම සහකාරිය වන භාර්යාව පිළිබඳ ව ද එසේ ම විය යුතුය.

තව ද දෙදෙනා ම එකිනෙකාට යටත් ව ජීවත් විය යුතු වේ. මෙහි යටත් වීම යනු යටත් කර ගැනීම නොව ප්‍රේමයෙන් සමානාත්මතාවෙන් හා ගෞරවයෙන් යුතුව පිළිගැනීම වේ.එකිනෙකාගේ අවශ්‍යතා සපුරාලමින් ජීවිතවලට ගෞරවයක් හිමිවන ලෙස කටයුතු කළ යුතු වේ.

භාර්යාව හා ස්වාමි පුරුෂයා එකිනෙකා කෙරෙහි දක්වන ප්‍රේමය ක්‍රිස්තුන් වහන්සේගේ සභාවට දක්වන ප්‍රේමය මෙන් විය යුතු බව, එපීස යැවුම් පත්‍රයේ සඳහන් වෙයි. සභාව තුළ කොපමණ ප්‍රශ්න උද්ගත වුවත් ක්‍රිස්තුන් වහන්සේ සභාව එනම් උන්වහන්සේ අදහාගන්නන්ට දක්වන ප්‍රේමයේ අඩුවක් නැත. ඒ ආදර්ශය පවුල තුළ ඇතිවිය යුතු බව දේව වචනයෙන් අපට පැහැදිලි වෙයි.

**දරුවන්ගේ වගකීම. -** එපීස 6 : 1-3

❖ ඔබේ දෙමාපියන්ට සමිඳාණන් වහන්සේ තුළ කීකරු වන්න. එය ඔබගේ යුතුකම ය.

❖ ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න.

දෙවියන් වහන්සේ විසින් පවුලට දෙන ලද තිළිණය වන්නේ දරුවන් ය. එබැවින් දරුවන් හදා වඩා ගැනීමේ දී ඔවුන්ට ආදරය කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන්නට මෙන් ම විනයානුකූල ව හැඩ ගැස්වීම දෙමාපියන් සතු වගකීමකි. එමෙන් ම දරුවන් ද දෙමාපියන්ගේ වචනයට අවනත ව කටයුතු කරමින් කීකරු වීමත් මවට හා පියාට ගෞරව දැක්වීමත් කළ යුතු වේ. දෙමාපියන්ට කීකරු හා ගෞරවයෙන් යුතුව ක්‍රියා කරන දරුවා සමාජයට ද යහපත් පුරවැසියෙකි.

පවුලක් ලෙස වර්ධනය වීමේ දී, දරුවන් තම සහෝදර සහෝදරියන් ගැන සැලකිලිමත් වීම, රැකබලා ගැනීම එකිනෙකාගේ අවශ්‍යතාවන් දැන හඳුනා ගැනීම, පවුලට විශ්වාසවන්ත ව සිටීම අවශ්‍ය ය. පවුලක සමගිය වෙනුවෙන් ක්‍රියා කරන සහෝදර සහෝදරියන් සිටීම පවුලට මහත් ආශිර්වාදයකි.

## සමාජය කෙරෙහි අපගේ යුතුකම් හා වගකීම්

**කිතුනුවකු තුළ තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති-** කොලොස්සි 3:12-17

❖ සමිඳාණන් වහන්සේ ඔබට කමා කළා මෙන් ඔබත් එකිනෙකාට කමා කරන්න.

❖ ඔබ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කුමක් කරතත් ඒ සියල්ල ස්වාමින් වහන්ස්ගේ නාමයෙන් කරමින් දෙවියන් වහන්සේට ස්තුති කරන්න.

❖ මේ සියල්ලට ඉහළින් සියල්ල සම්පූර්ණ ලෙස ඒකාබද්ධ කරන **ප්‍රේමයෙන්** සැරසෙන්න.

කිතුනුවන් ලෙස සමාජ ජීවිතයේ දී අපගේ ක්‍රියාවන් ස්වාමින් වහන්සේට ප්‍රසන්න ලෙසින් සිදු විය යුතු වේ. අපගේ වචන එකිනෙකාගේ ජීවිත ශක්තිමත් කිරීමට මිස, එකිනෙකාගේ ජීවිත බිඳ දැමීමට හේතු නො විය යුතු ය. එබැවින් වචනයෙන් හෝ ක්‍රියාවෙන් කුමක් කරතත් එය දේව ගෞරවය හා මහිමය හිමි වන පරිදි විය යුතු වේ.

තව ද අප මුහුණ දෙන ගැටලු අවස්ථාවන්වල දී ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ.ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කිරීමේ දී එකිනෙකා වෙනුවෙන් ඉවසීමෙන් යුතුව ක්‍රියා කිරීමත්, එකිනෙකාගේ වරදේ දී කමාව දීමත්, තමා අතින් වරදක් වූ විට කමාව යැදීමත්, කරුණාව පෙරදැරි ව ජීවත් වීමත් සිදු විය යුතු වේ.

**කියවා බලමු.**

**මතෙව් 25:31-46**

ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ පරිදි උන්වහන්සේ අදහන්නන් විසින් සමාජය තුළ ඉටු කළ යුතු, දේව රාජ්‍යයේ ගුණාංග කිහිපයක් මතෙව්තුමා සඳහන් කරයි. ඒ අනුව කිතුනු දරුවකු වශයෙන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීම සඳහා පවුල හා සමාජය තුළ වටිනාකම් ඉස්මතු කිරීම අපේ යුතුකමකි. එය පහත පරිදි දැක්විය හැකි ය.

සාගිනි ව සිටියෙමි - ඔබ මට කන්න දුන්නහු ය

පිපාසා වී සිටියෙමි - ඔබ මට බොන්න දුන්නහු ය

ආගන්තුක ව සිටියෙමි - ඔබ මා ගෙදරට පිළිගත්තහු ය

වස්ත්‍ර නැතිව සිටියෙමි - ඔබ මට වස්ත්‍ර දුන්නහු ය

රෝගාතුර ව සිටියෙමි - ඔබ මා බලාගත්තහු ය

හිර ගෙදර සිටියෙමි - ඔබ මා බලන්නට ආවාහු ය

❖ කිතුනු අපගේ ජීවිතවල අරමුණ දේව රාජ්‍යය උරුම කර ගැනීම යි. දේව රාජ්‍යය උරුමකර ගැනීමට ස්වාමින් වහන්සේ වදාළේ අප විසින් අන් අය කෙරෙහි (සමාජය කෙරෙහි) පවත්වා ගත යුතු ප්‍රේමය යි.

❖ එබැවින් කිතුනුවාගේ ප්‍රායෝගික ජීවිතය ජේසුස් වහන්සේ හා බද්ධ වීමෙන් සමාජය කෙරෙහි සංවේදී වන ජීවිත රටාවකින් සමන්විත විය යුතු වේ.

කිතුනු අප, ස්වාමින් වහන්සේ ඉදිරියේ විනිශ්චයට ලක්වන දිනක් උදා වේ. එදිනට අප සූදානම් විය යුතු වේ. අප අන් අයගේ ජීවිතවල යහපත් පැවැත්මට යමක් කරන්නේ ද එය ක්‍රිස්තුන් වහන්සේට ඉටු කරන ලද සේවයකි. එබැවින් ඉතා කුඩා තැනැත්තෙකුට වුව ද යමක් අප ඉටු කරන්නේ ද එය සග සම්පත් හිමි කර ගැනීමට පිටිවහලක් වනු ඇත.

තීතස් 3:1-2, ජාකොබ් 2: 1-4 හා යන බයිබල් පාඨ අප විමර්ශනය කරන විට සමාජය තුළ ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කරමින් ජීවත් වීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරයි.

❖ නිලධාරීන්ට හා ආණ්ඩු බලය ඇත්තන්ට යටත් වී කීකරු වීම.

❖ සියලු යහපත් වැඩට සූදානම් ව සිටීම.

❖ කිසිවකු ගැන අගුණ නො කීම හා කලහකාරී නො වීම.

❖ කාරුණික ව ආචාරශීලී ව සිටීම.

❖ දුප්පත් පොහොසත් බව හෝ සමාජයේ පවතින අනෙකුත් වෙනස්කම් නොසලකා, තරාතිරම් නො බලමින් කටයුතු කිරීම.

අපගේ ජීවිත ගමනේ දී පවුල තුළ දි මෙන් ම සමාජය තුළ දී ද ක්‍රියාකාරී විය යුතු ආකාරය අපි ඉගෙන ගත්තෙමු. එලෙස ක්‍රියාකාරී වන ඕනෑ ම ක්‍රියාවලියක දී නායකත්වය ගෙන කටයුතු කරන පිරිසක් ඉස්මතු වේ. එලෙස නායකත්වය ගෙන කටයුතු කරන අයගේ වචනයට කීකරු ව කටයුතු කිරීමත් සියලු යහපත් ක්‍රියාවන්හී දී තම සහය ලබා දීමත් කිතුනුවකුගේ යුතුකම වේ.

එලෙස ක්‍රියා කරන විට මතුවන ගැටලු අවස්ථාවන්හි දී එකිනෙකා විවේචනය කිරීම, කලහකාරී වීම වෙනුවට කාරුණික ව හා ආචාරශීලී ව කටයුතු කිරීම ඉතා වැදගත් වේ. (උදා:- ක්‍රීඩාවක දී හෝ තරගයක දී ලැබෙන තීන්දු තීරණ පිළිගැනීමට පුරුදු ව සිටීම.)

## සිතා බලමු

වර්තමාන සමාජය දෙස බලන කල පුද්ගලයාගේ, පවුල් සංස්ථාවේ, සමස්ත සමාජයේ පිරිහීමක් සිදුවෙමින් පවතින බව පෙනී යයි. එසේ වීමට හේතු වී ඇත්තේ මිනිසා දේව කැමැත්තට පිටුපා ක්‍රියා කිරීමයි.

මම, මගේ, මට, යන ආත්මාර්ථකාමී බව නොව අප, අපගේ, අපට යන පරාර්ථකාමී බව පොදු බව, අප ජීවිතවල ගොඩනගා ගත යුතු වේ. තවද අපගේ ජීවිත වෙනස්කර හැඩ ගස්වා ගැනීමෙන් තමාටත්, තම පවුලටත්, සමස්ත සමාජයටත් යහපතක් ඉටු කිරීමට සිතා ගනිමු.

**ක්‍රියාකාරකම**

1.කොලොස්සි 3: 12-17 දක්වා ඇති කිතුනු ජීවිත ප්‍රතිපත්ති 3ක් පිළිබඳ කරුණු ගොනු කරන්න.

2.මතෙව් 25: 31-46 හි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ කරුණු තුළින් අප සමාජයේ ක්‍රියා කළ යුතු ආකාර 3 ක් පිළිබඳ විස්තර කරන්න.